ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව பிரதேச அபிவிருத்தித் திணைக்களம் **Regional Development Department**

මෙහෙයුම් උපදෙස් අංක : RDD/PR-COVID19/2020/03 හා 04 (A-01)

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත
කොළඹ 01

2020.07.08

**"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකම යටතේ, ලියාපදිංචි සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත**

**"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකමෙහි මෙහෙයුම් උපදෙස් සඳහා වන පරිශිෂ්ඨය**

ශ්‍රී ලංකා මහ බැංකුවේ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකමෙහි 2020.06.19 දින දරණ අංක : RDD/PR-COVID19/2020/03 සහ 04 ට අදාළ මෙහෙයුම් උපදෙස් හා බැඳේ.

ඉහත ණය යෝජනා ක්‍රමය කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම හා බලපත්‍රලාභී වාණිජ බැංකු මඟින් සිදු කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගනිමින්, පොරොන්දු පත්‍රිකා (Promissory Notes) සුරක්ෂිත කිරීම සඳහා ඉදිරිපත් කරන ඇප සුරැකුම් පිළිබඳ විධිවිධාන තවදුරටත් විශ්ලේෂණය කෙරේ.

ඒ අනුව, 2020.06.19 දිනැතිව නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අංක : RDD/PR-COVID19/2020/03 හා 04 හි වගන්ති අංක 7.1 සිට 7.4 දක්වා පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

1. මෙහෙයුම් උපදෙස් හි 7.1 වගන්තියේ දක්වා ඇති "බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත අරමුදල් මුදා හැරීම" යන වගන්තිය අවලංගු කර, ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කළ යුතුය.

7.1 උප ණය ගැනුම්කරුවන්ගේ යෝග්‍යතාව හා මුදා හැරීමට නියමිත ණය මුදලට අදාළ අනුමැතින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් පසු, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින්, නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ණය ගිවිසුම (ඇමුණුම A-01-I) පහත පත්‍රිකා සමඟ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත භාර දිය යුතුය.

අ) උප ණය ගැනුම්කරුවන් වෙත මුදා හැර ඇති/මුදා හැරීමට නියමිත ණය පිළිබඳ විස්තර (උපලේඛනය I)

ආ) ඉහත 7.1 (අ) හි දක්වා ඇති මුළු ණය මුදලෙහි අනුමත වටිනාකමට අදාළ පොරොන්දු පත්‍රිකාව (Promissory Note) (උපලේඛනය II)

2. මෙහෙයුම් උපදෙස් හි 7.2 වගන්තියේ දක්වා ඇති "බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත අරමුදල් මුදා හැරීම" යන වගන්තිය අවලංගු කර, ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කල යුතුය.

7.2.1 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ණය ගිවිසුම සමඟ ඉදිරිපත් කරනු ලබන පොරොන්දු පත්‍රිකාව (Promissory Note) පහත දෑ මඟින් සුරක්ෂිත කළ යුතුය.

7 වන මහල, අංක 30, ජනාධිපති මාවත, තැ . පෙ . 590, කොළඹ 01, ශ්‍රී ලංකාව
7 ஆம் மாடி, இல. 30 சனாதிபதி மாவத்தை கொழும்பு 1 த. பெ. இல. 590, கொழும்பு 01, இலங்கை
Level 7, No. 30, Janadhipathi Mawatha, Colombo 1 P. O. Box. 590, Colombo 01, Sri Lanka.
94 11 2477447/437 94 11 2477734 www.cbsl.gov.lk

අ) රාජ්‍ය සුරැකුම්පත් (භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර-SLDB)

ආ) රන් සහ ගන රන්

ඉ) ශ්‍රී ලංකා මූල්‍යකරණ ව්‍යාපාරකරණ ප්‍රමිත අංක 9ට අනුකූලව උකස් කළඹ ද ඇතුලත්ව අදාල බලපත්‍රලාභී වාණිජ බැංකුවේ අදියර 1 යටතේ වර්ගීකරණය කර ඇති ක්‍රියාකාරී ණය අයවීම්.

7.2.2. "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකමෙහි අදියර II යටතේ ණය ගිවිසුම සමඟ භාරදෙන සෑම පොරොන්දු පත්‍රිකාවක්ම ඉහත 7.2.1 යටතේ දක්වන ලද සුරැකුම් මඟින් සුරක්ෂිත කළ යුතු අතර, මෙහි විස්තර කර ඇති උපලේඛන සහිත ණය ගිවිසුම හා සමඟ විය යුතුය. එක් එක් පොරොන්දු පත්‍රය සඳහා තබන සුරැකුම් මත පදනම්ව පහත සඳහන් උකස් ගිවිසුම/ගිවිසුම් තිබිය යුතුය.

අ) භාණ්ඩාගාර බිල්පත් සඳහා උකස් ගිවිසුම (ඇමුණුම A-01-II )

ආ) භාණ්ඩාගාර බැඳුම්කර සඳහා උකස් ගිවිසුම (ඇමුණුම A-01-III )

ඉ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා උකස් ගිවිසුම (ඇමුණුම A- 01-IV)

ඊ) රන් සහ ගන රන් (Bullion) සඳහා සඳහා උකස් ගිවිසුම (ඇමුණුම A-01-V )

උ) උකස් කළඹ ඇතුළු ණය ලැබීම් සඳහා උකස් ගිවිසුම (ඇමුණුම A-01-VI )

7.2.3 ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ඇමුණුම A-01-VII හි පරිදි, ණය ගිවිසුම සමඟ භාරදෙන සෑම පොරොන්දු පත්‍රිකාවක් වෙනුවෙන් උකස් තැබීමට බලාපොරොත්තු වන මෙවලම් පිළිබඳ තොරතුරු, පොරොන්දු පත්‍රිකාව ලබා දීමට පෙර බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් විද්‍යුත් තැපැල ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දිය යුතුය.

7.2.4 ණය ගිවිසුමේ සහ උකස් ගිවිසුමේ සඳහන් ක්‍රියාපටිපාටීන්, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පිළිපැදිය යුතුය.

3. මෙහෙයුම් උපදෙස් හි 7.3 වගන්තියේ දක්වා ඇති "බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත අරමුදල් මුදා හැරීම" යන වගන්තිය අවලංගු කර, ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කළ යුතුය.

7.3.1 රාජ්‍ය සුරැකුම්පත් වල මිලකරණය කිරීමට ඔවුන්ගේ කෙටි කාලීන/දිගු කාලීන වටිනාකම ගණනය කිරීම මත පදනම්ව ණය හිමියා විසින් උකස් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වල මුහුණත් අගය ණයගැතියා වෙත දන්වනු ලබයි.

7.3.2 උකස් කරනු ලබන ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වල මුහුණත් අගය පහත සඳහන් සූත්‍රය මඟින් තීරණය කළ යුතුය.

මුහුණත් අගය (ඇ.ඩො.) = ණය මුදල x 1.05 / එතැන් (SPOT) විනිමය අනුපාතිකය
(ශ්‍රී ලංකා රුපියල්/ඇ.ඩො.)

7.3.3. රාජ්‍ය සුරැකුම්පත් හැර, සුරැකුම් මෙවලම/මෙවලම් සඳහා සුදුසු සීමාව (Haircut) සියයට දහයක් (10%) විය යුතුය.

7.3.4 වරින්වර, එවැනි සීමාවන් (Haircut) වෙනස් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය. සුරැකුම් මෙවලම/මෙවලම් හි සීමාවන් (Haircut) හි කිසියම් හිඟයක් ඇති වුවහොත් වහාම නැවත පිරවිය යුතුය.

7.3.5 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර, ඇප තැබීමට අවශ්‍ය වූ විට, ඔවුන් විසින් එම භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වල විස්තර විද්‍යුත් මාධ්‍යක් වන, මාර්ගගත විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතිය (OEBS) හරහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දිය යුතු අතර, ඇප සුරැකුම් කල් පිරීමට ඉතිරි දින ගණන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදා හරින ලද ණය මුදලේ කල් පිරීමේ කාලසීමාවට වඩා අඩු නොවිය යුතුය.

4. මෙහෙයුම් උපදෙස් හි 7.4 වගන්තියේ දක්වා ඇති "බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත අරමුදල් මුදා හැරීම" යන වගන්තිය අවලංගු කර, ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කළ යුතුය.

7.4 නිසි පරිදි සම්පූර්ණ කරන ලද උපලේඛන හා ණය ගිවිසුමේ දෘඩ පිටපත් බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් ලැබීමෙන් පසු, උකස් ගිවිසුමේ නිරවද්‍යතාව පරීක්ෂා කිරීමෙන් අනතුරුව, අදාළ ණය මුදල බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් වෙත මුදා හැරීමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. කෙසේ වෙතත්, අදාළ දිනයේ මධ්‍යහන 12.00 ට පෙර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද උපලේඛන හා ණය ගිවිසුමේ දෘඩ පිටපත් නොලැබුණහොත් ණය මුදල් එදිනම මුදා හැරීම සිදු නොකරයි.

මෙහෙයුම් උපදෙස් හි අනෙකුත් සියලු වගන්ති සංශෝධනය නොවේ.

මෙම මෙහෙයුම් උපදෙස් පරිශිෂ්ඨයෙහි අන්තර්ගතය, ඔබ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තුවල/ශාඛාවල නිළධාරින්ගේ අවධානයට යොමු කරන මෙන් ඉල්ලමි.

මෙයට විශ්වාසී

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

7 වන මහල, අංක 30, ජනාධිපති මාවත, තැ. පෙ. 590, කොළඹ 01, ශ්‍රී ලංකාව
7 ஆம் மாடி, இல. 30 சனாதிபதி மாவத்தை கொழும்பு 1 த. பெ. இல. 590, கொழும்பு 01, இலங்கை
Level 7 , No. 30, Janadhipathi Mawatha, Colombo 1 P. O. Box. 590, Colombo 01, Sri Lanka.
94 11 2477447/437 94 11 2477734 www.cbsl.gov.lk